ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ)ගෞරව උපාධි වැඩසටහන 2020/2021

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021

SNE5546/ESE5246 - අන්තර්කරණ පන්ති කාමරවල ළමයින් සඳහා මනා අධ්‍යාපන පරිසරයක් නිර්මාණය කිරීම

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.08.15 වේලාව -පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ සමාජීය, චිත්තවේගීය හා චර්යාත්මක දුෂ්කරතා යන පද ඔබේ වචනයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. අන්තර්කරණ ඉගෙනුම් පරිසරයක් යනු කුමක්දැයි ඔබේ වචනයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. සාමාන්‍යයෙන් සංවර්ධනය වන සමවයසේ මිතුරන් අන්තර්කරණ අධ්‍යාපයේ ප්‍රතිලාභ ලබාගන්නේ කෙසේදැයි යන්න පැහැදිලි කරන්න.

04. 'විනය' සහ 'දඬුවම' යන සංකල්ප දෙක (02) සංසන්දනය කරන්න.

05. අන්තර්කරණ අධ්‍යාපනය සඳහා සමාජීය පරිසරයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

06. අන්තර්කරණ අධ්‍යාපනයේ 'උපදේශක ආකෘතිය' විස්තර කරන්න.

07. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ අන්තර්කරණ අධ්‍යාපන භාවිතයන් ක්‍රියාත්මක කිරීමේ අභියෝග පහක් (05) වත් පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ පාසල්වල අන්තර්කරණ අධ්‍යාපන ව්‍යවහාරය වැඩිදියුණු කිරීමට සේවාස්ථ ගුරු සංවර්ධනය අවශ්‍ය වන්නේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) අන්තර්කරණය කිරීමේ ආකෘති තුනක් (03) සුදුසු උදාහරණ සපයමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 09)

(ii) ඔබගේ පාසලේ පරිපූරක අධ්‍යාපනඥ ආකෘතිය (Para Educators Support Model) ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 11)

10. (i) දරුවන්ගේ පෞද්ගලික අවශ්‍යතාවන් සහ රුචිකත්වයන් ගුරුවරුන් විසින් වටහා ගන්නේ කෙසේ ද? (ලකුණු 08)

(ii) පන්තිකාමරයක් තුළ කුමන ආකාරයේ විෂයමාලා විවිධාංගීකරණයක් නිරීක්ෂණය විය යුතු ද? (ලකුණු 12)

11. (i) ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපනය ව්‍යවහාරයේ දී ඇතිවන ගැටලු පහත කරුණු ඔස්සේ පැහැදිලි කරන්න.

(i) විෂයමාලාව

(ii) සහයක තාක්ෂණය සඳහා ප්‍රවේශය

(iii) දෙමාපිය ආකල්ප

(iv) ආබාධිත සිසුන් හඳුනාගත හැකි වෘත්තිකයන්ගේ /ප්‍රවීණයන්ගේ හිඟකම

(ලකුණු 4 x 5 = 20)

12. (i) විෂයමාලා විවිධාංගීකරණයට බලපාන සාධක මොනවාද ? (ලකුණු 10)

(ii) ගුරුවරුන්ට විෂයමාලාව විවිධාංගීකරණය කළහැකි ක්‍රම පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. (i) සිසුන්ගේ සූදානම යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් දැයි ඔබේ වචනයෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(ii) සිසුන්ගේ සූදානම හඳුනා ගැනීමට යොදාගත හැකි උපාය මාර්ග මොනවා ද? (ලකුණු 07)

(iii) අන්තර්කරණ පන්තිකාමරයක, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ සූදානම වැඩිදියුණු කිරීම ඔබ සිදුකරන්නේ කෙසේදැයි සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

14. (i) ඉගෙනුම් සැලසුම්කරණ ආකෘතිය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) K.W.L ක්‍රමය විස්තර කර එය අන්තර්කරණ අධ්‍යාපනය සාර්ථක කර ගැනීමට යොදාගත හැක්කේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 12)

හිමිකම් ඇවිරිණි.